Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

හාරිස්පත්තුවේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 02 | පී. එල්. 1-2006 (අංක 3/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව) රු. 24,250-10x250-10 x 270-10 x 300-12 x 330 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. |

* මෙහි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පරිපාටියේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් 5 ශ්‍රේණිය සමත්වීම දක්වා අඩු කර බඳවා ගැනීමට ක්‍රියාකරනු ලැබේ.

කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩුවට පත් කරනු ලැබේ.

ව්‍යුහගත පරීක්ෂණය :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය 100 | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. උපරිම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

*ඉහත තනතුර සඳහා අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
2. අයදුම්කරු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදල නොවේ.)
5. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
7. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූ හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූ අයෙකු නොවිය යුතුය.
8. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්, ආදේශක, තාවකාලික කොන්ත්‍රාත් ස්වේච්චාවෙන් සේවය කරනු ලබන සේවකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

*සේවා කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තෝරාගනු ලබන සේවකයන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවය හෝ රජයේ දෙපාර්තමේන්තු හෝ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12 x 8 ප්‍රමාණයේ කඩදසියක අයදුම්පත් සකස් කර 2018 නොවැම්බර් මස 23 දිනට පෙර "ලේකම්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, තිත්තපජ්ජල, වැරැල්ලගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදල තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
4. වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,
5. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
6. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම් වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
7. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරකදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ බලය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

කේ. පී. එස්. ඩී. පතිරණ,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 17 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල,
වැරැල්ලගම.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව***

*. .. . . . . . . . . . . . තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :...........................................................................
02. තැපැල් ලිපිනය :...........................................................................
03. උපන් දිනය අවුරුද්ද :.................. මාසය :.................. දිනය :..................
04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ අවු:.................. මාස :.................. දින:..................
05. ස්ත්‍රී/පුරුෂභාවය :...........................................................................
06. විවාහක/අවිවාහක බව :...........................................................................
07. ජාතික හැඳුනුම්පත් අංකය :...........................................................................
08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද/එසේ නම් පරම්පරාවෙන්ද/ලියාපදිංචි වී මෙන්ද යන වග :.......................................
09. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :..................................................
10. අධ්‍යාපන සුදුසුකම් :

    වර්ෂය :........................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෙනත් සුදුසුකම් :...........................................................................
12. සේවා පළපුරුද්ද :...........................................................................
13. යම්කිසි වරදකට හෝ කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත්නම් ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු බවට පත්වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට සිදුවන බවත් දනිමි.

.................................;

දිනය :..............................

අයදුම්කරුගේ අත්සන.